# දැන්වීමයි

# හෝමාගම ප්‍රාදේශීය සභාව

හෝමාගම ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පහත පුරප්පාඩු සඳහා විවෘත බඳවා ගැනීම් ක්‍රමය යටතේ සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | පුරප්පාඩු | වැටුප් පරිමාණය | මූලික සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | රියදුරු (III ශ්‍රේණිය) | 04 | PL 3-2025 (රු42,780/-) | **අධ්‍යාපන සුදුසුකම්** :- අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් (06) සමත් වී තිබීම( එක් වරක දී විෂයන් (05) අවම වශයෙන් සමත් වී තිබිය යුතුය),<br>**වෘත්තීය සුදුසුකම්** :- i. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන්වැගන් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර (03) ට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය)<br>ii. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.<br>**පළපුරුද්ද:-** බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය.(පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය)<br>**කායික සුදුසුකම්:-** අවම උස අඩි පහක් (05') විය යුතුය.<br>දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.<br>**සැ.යු:** බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් වන්නේ නම් වඩාත් යෝග්‍ය වේ. බර වාහන /බර යන්ත්‍ර ක්‍රියාකරුවන් ලෙස වැඩකිරීමේ පළපුරුද්ද පවතී නම් අමතර සුදුසුකමක් ලෙස සැලකේ. |
| 02 | සෞඛ්‍ය කම්කරු (III ශ්‍රේණිය) | 04 | PL 1-2025 (රු.40,000/-) | **අධ්‍යාපන සුදුසුකම්** :- 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.<br>**වෘත්තීය සුදුසුකම්** :- අදාළ නැත<br>**පළපුරුද්ද** :- අදාළ නැත<br>**කායික සුදුසුකම්** :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. |
| 03 | ආදාහනාගාර ක්‍රියාකරු (III ශ්‍රේණිය) | 01 | PL 2-2025 (රු.41,800/-) | **අධ්‍යාපන සුදුසුකම්** :- අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය).<br>**වෘත්තීය සුදුසුකම්** :- අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හා අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>**පළපුරුද්ද** :- අදාළ නොවේ<br>**කායික සුදුසුකම්** :- සෑම අයදුම්කරුවෙකුම තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. |

**පොදු කොන්දේසි:**

- ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
- යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- **වයස :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩුවිය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය විය යුතුය.
- **පදිංචිය :** අවසන් දිනට පෙර අවම වශයෙන් වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

**අයදුම්කිරීම:**

ඇමුණුමේ සඳහන් අයදුම්පත සමග අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය (අදාළ නම්), ප්‍රාදේශීය ලේකම් සහතික කළ ග්‍රාම නිලධාරී සහතිකය සහ පළපුරුදු සනාථ කරන සහතික වල පිටපත් සමග 2026.11.27 දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, හෝමාගම ප්‍රාදේශීය සභාව, උසාවිය පාර, හෝමාගම"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කරන්න. (රාජ්‍ය සේවකයින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය).

**ලේකම්,**
**හෝමාගම ප්‍රාදේශීය සභාව.**
**දිනය: 2026.11.17**

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED